# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1646/28 - 2010 මාර්තු 26 වැනි සිකුරාදා - 2010.03.26

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් පිරවීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ඉල්ලා අස්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දැනුම් දී ඇති හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස මුරලි රගුනාදන් මහතා නාම යෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, මුරලි රගුනාදන් මහතා එම පුරප්පාඩුව සිදුවූ නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 මාර්තු මස 24 වන දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

04-348

1A - G 12669— 355 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.